


# 9 ශ්‍රේණිය - චිත්‍ර කලාව

# වාහල්කඩ හා වටදාගෙය

නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතාව මට්ටම 7.1 : ඓතිහාසික ගෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අගය කරයි.




''වාහල්කඩ හා වටදාගෙය නිර්මාණ අගයමු.''

**වාහල්කඩ**

- දාගැබේ සතර දිසාවේ දාගැබට සම්බන්ධ ව තැනූ සුවිශේෂ ගෘහ නිර්මාණ විශේෂයක් ලෙස හැඳින්විය හැකි ය.
- වාහල්කඩ ආයක, ආයික යන නම්වලින් හඳුන්වා ඇත.
- දාගැබේ ශක්තිමත් බව හා දාගැබ අලංකාරයට එක් කළ නිර්මාණයක් වශයෙන් සැලකේ.
- දාගැබේ සිවු දිශාවෙහි මල් ආසන හා සම්බන්ධ වන ලෙස මෙය නිර්මාණය කර තිබේ.
- වාහල්කඩෙහි පාදම කොටස ගලෙන් නිර්මාණය කොට ඇති අතර ඉහළ කොටසේ ඇති විමාන නිර්මාණය කොට ඇත්තේ ගඩොළිනි.
- ගලින් ඉදිවූ පහළ කොටසෙහි බොරදම් තීරු ගණනාවක් ඇත. මෙම බොරදම් තීරු ඇත්, මකර, වාමන, හංස ආදිය රූපවලින් කැටයම් කර ඇත.
- ඇතැම් වාහල්කඩවල ගඩොළින් ඉදි කළ කොටසෙහි විමාන තුනක් දක්නට ඇති අතර ඒ තුළ බුද්ධ රූප හා දේව රූප තැන්පත් කර තිබූ බව අනුමාන කෙරේ.
- වාහල්කඩ දෙපස විසිතුරු කැටයම් සහිත ගල් ටැම් දක්නට ලැබේ. මේවා කල්පලතා, කල්ප වෘක්ෂ හා නිදහස් සත්ත්ව මෝස්තර ඇසුරින් අලංකාර කර ඇත.
- මෙම ගල් ටැම් මත ඇත්, අස්, ගව, සිංහ යන රූප නිමවා ඇත. මින් සිවු දිසාව සංකේතවත් වන බව අදහස් කෙරේ.

# විවිධ අවධිවලට අයත් උසස් ලක්ෂණ සහිත වාහල්කඩ නිර්මාණ

## අනුරාධපුර යුගය

- මිහින්තලයේ කණ්ඨක චේතියේ වාහල්කඩ

## පොළොන්නරු යුගය

- රන්කොත් වෙහෙරේ වාහල්කඩ



මිහින්තලයේ කණ්ඨක චේතියේ වාහල්කඩ



රන්කොත් වෙහෙරේ වාහල්කඩ

# වටදාගෙය

- දාගැබක ආරක්ෂාව පිණිස දාගැබ වටා ඉදි කරන ලද ගෘහය වටදාගෙය ලෙස හැඳින්වේ.
- ථූපඝරය, චේතියඝර, සෑගෙය යන නම්වලින් ද ව්‍යවහාර කර ඇත.
- ශ්‍රී ලාංකික බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ තවත් සුවිශේෂ නිර්මාණයක් වන වටදාගෙය කුඩා දාගැබ් සඳහා ඉදි කර ඇති බවට සාධක හමුවේ.
- දාගැබ වටා නංවන ලද කුලුනු මත වටදාගෙයි වහලය රඳවා තිබූ බව සැලකේ.
- වෘත්තාකාර ගෘහයක් වූ මෙහි වහලය දාගැබට අනුරූප ව එයට ආවරණයක් වන සේ නිර්මාණය කර තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය.
- වහලය දරා සිටින ගල් කණු ඉතා සියුම් කැටයමින් අලංකාර කර තිබේ.
- ශ්‍රී ලංකාවේ ඉදි වූ මුල් ම වටදාගෙය ථූපාරාම වටදාගෙය යි.

# විවිධ අවධිවලට අයත් උසස් කලාත්මක ලක්ෂණ සහිත වටදාගෙය නිර්මාණ

**අනුරාධපුර යුගය**

- තිරියාය වටදාගෙය

**පොළොන්නරු යුගය**

- මැදිරිගිරියේ වටදාගෙය
- පොළොන්නරුවේ වටදාගෙය



ථූපාරාමයේ වටදාගෙය



තිරියාය වටදාගෙය



මැදිරිගිරියේ වටදාගෙය



පොළොන්නරුවේ වටදාගෙය

## පහත ප්‍රශ්ණ සඳහා පිලිතුරු සපයන්න

01. වාහල්කඩ යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
02. වාහල්කඩෙහි නිර්මිත සත්ත්ව රූප මොනවා ද?
03. කලාත්මක අතින් උසස් ම වාහල්කඩ ඇති ස්ථානය නම් කරන්න.
04. දැනට සුරක්ෂිතව ඇති පොළොන්නරු යුගයට අයත් වාහල්කඩක් නම් කරන්න.
05. වාහල්කඩ හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
06. වටදාගෙය යනු කුමක් ද?
07. ශ්‍රී ලංකාවේ ඉදිවූ මුල් ම වටදාගෙය කුමක් ද?
08. වටදාගෙය ඉදි කරනු ලබන්නේ ප්‍රමාණයෙන් විශාල චෛත්‍ය සඳහා ද කුඩා චෛත්‍ය සඳහා ද?
09. දැනට ලංකාවේ දක්නට ලැබෙන වටදාගෙය කිහිපයක් නම් කරන්න.
10. වාහල්කඩ හා වටදාගෙය නිර්මාණය සඳහා යොදාගන්නා මාධ්‍ය නම් කරන්න.

පහත වීඩියෝ බලන්න

https://youtu.be/pRmwfRcCKBY
https://youtu.be/yXJ09uCJf1s
https://youtu.be/JOB0PAgFmsA